# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2346/39 - 2023 අගෝස්තු මස 23 වැනි බදාදා - 2023.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. -බී. 104/44(VI)

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත**

114 වන වගන්තිය යටතේ වූ නියමය

"ජෝන් ඩි මෙල් භාරයේ" භාරකරුවන්, එනම් -

1. රොමේෂ් ඩි මෙල් ;
2. නාලිනී සිරිමා එල්ලාවල ; සහ
3. ශායිලා අමාලීන්,

විසින්, (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වන වගන්තිය යටතේ ඔවුන් සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙත ඉල්ලුම් කර ඇති හෙයින් ;

ඉහත කී ආඥාපනත මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මම, එකී භාරකරුවන් සංස්ථාගත කිරීමට මේ නියමයෙන් බලය පවරන අතර -

(අ) කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, ෂෙල්ටන් අර්නස්ට් අබේසූරිය විසින් සහතික කරන ලද 1999 මාර්තු මස 16 වැනි දිනැති අංක 7304 දරන භාර ඔප්පුව යටතේ යථා පරිදි පත් කරන ලද ඉහත නම් සඳහන් භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් "ජෝන් ඩි මෙල් භාරය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු යයි ද;

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමය සහ අභිධානය යටතේ, එකී භාරය වෙනුවෙන්, යම් චංචල හෝ නිශ්චල දේපළක් මිල දී ගැනීම, භාර ගැනීම, දැරීම, ණයට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි යයි ද; සහ


1A - G 40203 — 07 (2023/08)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ඇ) එකී භාරයට අදාළව පැන නගින සියලු නඩුවල දී සහ නඩු කටයුතුවලදී ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ස්ථානයක ඕනෑම අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට, නඩු පවරනු ලැබීමට, උත්තර දීමට හා උත්තර දෙනු ලැබීමට, විත්තිවාචක ඉදිරිපත් කිරීමට හා විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතිය අනුව හැකියාව සහ බලය ඇත්තේ යයි ද,

විධාන කොට ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම, නැතහොත් අවශ්‍ය යයි මට පෙනී යන ආකාරයට කලින් කල සුළු වශයෙන් වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මා විසින් කරනු ලැබිය හැකි ය.

**ආචාර්ය විජයදාස රාජපක්ෂ,**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

EOG 08 - 0256

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.